# UNCOVERING THE ANCIENT CULTURAL INTERACTIONS AND TIES BETWEEN NĀGARJUNAKOṆḌA AND SRI LANKA

NS Gunawardena[1]

**Abstract**

This research focuses into the historical and cultural relations between Nāgarjunakoṇḍa and Sri Lanka during ancient times. The primary objective of this study is to elucidate the depth and significance of these cultural interactions, exploring their influence on art, architecture, religion, trade, and language. To achieve this objective, a comprehensive examination of historical records, archaeological findings, and scholarly literature has been conducted. Methodologically, this research relies on a multidisciplinary approach, integrating data from diverse sources to provide a holistic understanding of the ancient ties between Nāgarjunakoṇḍa and Sri Lanka. The research draws from ancient texts, inscriptions, archaeological excavations, and comparative analyses of art and architecture. The key findings of this study reveal that there was a cultural exchange between Nāgarjunakoṇḍa and Sri Lanka. Buddhism played a central role in facilitating these exchanges, leading to the transmission of religious teachings, texts, and artifacts. Architectural styles, artistic motifs, and trade connections were shared, leaving a lasting imprint on both regions. In conclusion, the cultural relations between Nāgarjunakoṇḍa and Sri Lanka during ancient times were profound and enduring. The findings underscore the importance of such historical interactions in shaping the cultural and religious landscapes of both regions. The lessons learned from these ancient ties can inform contemporary intercultural relations and cooperation. This research offers insights into the interconnectedness of societies in the past and highlights the value of preserving and studying our shared cultural heritage.

***Keywords:*** *Nāgarjunakoṇḍa, Sri Lanka, cultural interactions, ancient ties, Buddhism, art, architecture, trade, history*.

[1] Professor, Department of History, University of Kelaniya

Email: nadee@kln.ac.lk https://orcid.org/0000-0002-0830-125X

Accepted the revised version : 02 December 2023
This work is licensed under CC BY-SA 4.0. To view a copy of this license, visit http://creativecommons.org/licenses/by-sa/4.0/

# නාගර්ජුනකොණ්ඩ දේශය සහ ශ්‍රී ලංකාව අතර පැවති පැරණි සංස්කෘතික අන්තර් සම්බන්ධතා හඳුනාගැනීම


**සාරසංක්ෂේපය**

මෙම පර්යේෂණය තුළින් නාගර්ජුනකොණ්ඩය සහ ශ්‍රී ලංකාව අතර පැවති ඓතිහාසික හා සංස්කෘතික සබඳතා කෙරෙහි අවධානය යොමු කරයි. මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වන්නේ සංස්කෘතික අන්තර්ක්‍රියාවල ගැඹුර සහ වැදගත්කම පැහැදිලි කිරීම, කලාව, ගෘහ නිර්මාණ ශිල්පය, ආගම, වෙළඳාම සහ භාෂාව කෙරෙහි ඒවායේ බලපෑම ගවේෂණය කිරීමයි. මෙම පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා ඓතිහාසික වාර්තා, පුරාවිද්‍යාත්මක සොයාගැනීම් සහ ද්විතීය මූලාශ්‍රය පිළිබඳ පුළුල් පරීක්ෂණයක් සිදු කර ඇත. මෙම පර්යේෂණය බහුවිධ ප්‍රවේශයක් මත රඳා පවතින අතර, නාගර්ජුනකොණ්ඩ සහ ශ්‍රී ලංකාව අතර පැරණි බැඳීම් පිළිබඳ පරිපූර්ණ අවබෝධයක් ලබා දීම සඳහා විවිධ මූලාශ්‍රයවලින් දත්ත ඒකාබද්ධ කොට ඇත. මෙම අධ්‍යයනයේ ප්‍රධාන සොයාගැනීම්වලින් හෙළිවන්නේ නාගර්ජුනකොණ්ඩ දේශය සහ ශ්‍රී ලංකාව අතර සමීප සංස්කෘතික සබඳතාවයක් පැවති බවයි. ඉහත කී සමීපසබඳතාවය තීව්‍ර කිරීමට බුද්දහම ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. වාස්තුවිද්‍යාත්මක ශෛලීන්, කලාත්මක ආකෘතීන් සහ වෙළඳ සම්බන්ධතා අනාවරණය කරගත හැකිවිය. අවසාන වශයෙන්, තහවුරුවූ කරුණක් වූයේ නාගර්ජුනකොණ්ඩය සහ ශ්‍රී ලංකාව අතර පැවති මෙම සංස්කෘතික සබඳතා ඉතා ගැඹුරු සහ අනාදිමත් කාලයක් සිට පැවතඑන්නක් බවය. කලාප දෙකෙහිම සංස්කෘතික හා ආගමික පසුබිම හැඩගැස්වීමේදී මෙම අන්තර්ක්‍රියාවල වැදගත්කම ගම්‍යමානවිය. මෙම පුරාණ බැඳීම්වලින් උගත හැක්කේ සමකාලීන අන්තර් සංස්කෘතික සබඳතා සහ සහයෝගීතාව වර්ධනය කිරීමේදී අතිශය වැදගත්බවය. මෙම පර්යේෂණය අතීත සමාජයන් හි අන්තර් සම්බන්ධිතාවය පිළිබඳ අවබෝධයක් ලබා දෙන අතර අපගේ සංස්කෘතික උරුමයන් සංරක්ෂණය කිරීමේ සහ අධ්‍යයනය කිරීමේ වටිනාකම ඉස්මතු කරයි.


**ප්‍රමුඛ පද:** *නාගර්ජුනකොණ්ඩ, ශ්‍රී ලංකාව, සංස්කෘතික අන්තර් ක්‍රියාකාරකම්, බුද්ධාගම, කලාව*

**පර්යේෂණ මාතෘකාවේ පසුබිම හැඳින්වීම**

1920 වර්ෂයේ දී පෙබරවාරි මස 21 වන දින ආන්ද්‍රා දේශයේ පාසැල් ගුරුවරයෙකු විසින් ප්‍රදේශවාසීන්ගේ ද ආධාර ඇතිව කැලයේ සැඟවී තිබුණු නාගර්ජුනකොණ්ඩ නිම්නය සොයාගන්නා ලදි. මෙහිදී මෙම ස්ථානයේ තිබී ශිලා ස්ථම්භයක් සොයාගන්නා ලද අතර එම පුවත ඉන්දීය රාජ්‍ය නිලධාරීන් අතර ද ප්‍රචලිත විය. මින් පසුව ශ්‍රී රංගස්වාමි සරස්වතී, මෙම භූමියෙන් ගල් ගොඩැලි කිහිපයක් අනාවරණය කර ගන්නා ලදි. එහි තිබූ ප්‍රාකෘත භාෂාවෙන් රචිත ක්‍රි:ව දෙවන හා තුන්වන සියවස්වලට අයත් ශිලාලිපි කිහිපයක් පිටපත් කිරීමට ඔහුට හැකි විය. එම පණිවිඩය කෙටි කලක් තුළ දසත පැතිරිණි. 1926 ජූලි මාසයේ දී පොන්ඩිචේරියේ මහාචාර්යවරයෙකු වූ G. Jouveau Dubreuil (ජී. ජොවියු ඩුබ්රියල්) විසින් නාගර්ජුනකොණ්ඩය ආශ්‍රිත කෙටි කැණීමක් සිදු කරන ලදි. ඔහු විසින් නාගර්ජුනකොණ්ඩයෙන් සොයාගත් කැටයම් කිහිපයක් ප්‍රකාශයට පත් කිරීම නිසා බටහිර ලෝකයේ අවධානය නාගර්ජුනකොණ්ඩය සඳහා යොමුවිය. මෙම භූමිය Hamid Kariaishi (හමිඩ් කරේෂි) ගේ හා එවකට ඉන්දියාවේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධිකාරී වූ Longhurst (ලොන්ග්හාස්ට්) ගේ අවධානයට යොමුවිය. මෙම භූමිය බෞද්ධ ස්මාරකයන්ගෙන් පිරී ඇති බව Hamid Kariaishi (හමිඩ් කරේෂි) නිගමනය කිරීම හේතුවෙන් Longhurst (ලොන්ග්හාස්ට්) මුළු භූමියෙහි ම කැණීමක් කිරීමට තීරණය කරන ලදි (Stone, 1994). ඔහු 1927 සිට 1931 දක්වා එම භූමියේ කැණීම් කටයුතු සිදුකරන ලදි. මෙහිදී සොයාගත් ද්‍රව්‍යයන් පිළිබඳව Memories of the Archaeological Sruvey of India vol. 54 හි ප්‍රකාශට පත්කොට ඇත. ඉන් පසුව එම භූමියේ ටී. එන් රාමචන්ද්‍ර විසින් නැවත කැණීම් සිදුකරන ලදි. ඔහු ඒ පිළිබඳව Memories of the Archaeological Survey of India vol. 71 හි ප්‍රකාශයට පත් කොට ඇත.

1950 වසරේදී ආන්ද්‍රා ප්‍රදේශයේ දැඩි නියං තත්වයක් ඇතිවිය. මෙයට පිළියමක් වශයෙන් මෙම ප්‍රදේශයට විශාල වාරිපද්ධතියක අවශ්‍යතාව දැඩි වූ නිසා අතිවිශාල වූ නාගර්ජුනර්සාගර් බැම්ම ඉදි කරන ලදි. මෙම ඉදි කිරීමේදී නාගර්ජුනකොණ්ඩ පුරාවිද්‍යා භූමිය වතුරට යට විය. ඉන්දීය රජය මෙම පුරාවිද්‍යා භූමියේ අගය වටහාගත් නමුත් ජනතාවගේ ජල හිඟය දැවැන්ත ප්‍රශ්නයක් විය. ඉන්දීය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් නාගර්ජුනකොණ්ඩයේ පුරාවස්තු බේරාගැනීමට විශේෂිත වැඩපිළිවෙළක් යොදන ලදි. නාගර්ජුන සාගරය ඉදි කිරීමට මත්තෙන් එම භූමියේ තිබුණු බොහෝ පුරාවස්තු අසල ඇති කඳු ගැටයකට රැගෙන ගිය අතර එහි පැරණි භූමියේ පැවති ස්වරූපයටම ගෘහනිර්මාණ හා ගොඩනැගිලිවල කුඩා ආකෘතීන් ද නිර්මාණය කරන ලදි. ජවහර්ලාල් නේරුතුමාගේ සංකල්පනාවකට අනුව එම දූපතේ කෞතුකාගාරයක් ඉදිකොට පුරාවස්තූන් තැන්පත් කරන ලදි. 1954-1960 අතර කාලයේ දී ආචාර්ය ආර්. සුබ්‍රනියම් විසින් මෙම භූමියේ කැණීම් කටයුතු සිදුකරන ලදි. මෙහිදී ඔහු මුල් ශිලා යුගයේ සිට මධ්‍යතන යුගය දක්වා පුරාවස්තු මෙම ස්ථානයෙන් ලැබෙන බව

අණාවරණය කරන ලදි. ඔහුගේ අවසාන කැණීම් වාර්තාව Memories of the Archaeological Survey of India vol. 75 හි ප්‍රකාශයට පත් කොට ඇත.

ඉක්ෂවාකු ඉතිහාසය විශේෂයෙන්ම වාගේ ගොඩනැගීමට සිදුවනුයේ නාගර්ජුනකොණ්ඩයෙන් ලැබෙන ශිලාලේඛන පදනම්කරගෙනය. මෙම ශිලාලේඛන ගණනින් සියය ඉක්මවයි. මෙම සෙල්ලිපි ලියා ඇත්තේ සංස්කෘත හා ප්‍රාකෘත යන භාෂාවලිනි. මේ මඟින් ඉක්ෂවාකු රාජ වංශාවලිය සම්පූර්ණයෙන් ම ගොඩනැගිය හැකිය. මෙම ශිලා ලේඛන තුළින් ඉක්ෂවාකු රජුන්ගේ සමාජ හා ආගමික ඉතිහාසය පිළිබඳව වැදගත් තොරතුරු රාශියක් ලබාගත හැකිය. මෙම සෙල්ලිපි පිළිබඳව ප්‍රථමයෙන් (ජේ. වෝගල්) J. Vogel විසින් Epigraphia Indica volumes xx සහ xxi හි දක්වා ඇත (Vogel, 1929-30). ඩී. සී. සර්කාර් (Sircar,1963) හා එම්. රාමා රාඕ(Rama, 1967) ලිපි සපයා ඇත (Stone, 1994).

ශිලාලේඛන, නාණක සාක්ෂි හා පුරාණ ග්‍රන්ථයන්ට අනුව සාතවහනයින් යටතේ ප්‍රවේණි දාසයන් ලෙස ඉක්ෂවාකුන් නාගර්ජුනකොණ්ඩ දේශයේ ජීවත් විය. සාතවාහන රාජවංශය (Sātavāha Dynasty) බිඳවැටීමත් සමග ම පළමුවන චාම්තමූල (Cāmtamūla) යටතේ ඉක්ෂවාකුන් නාගර්ජුනකොණ්ඩය අගනගරය කරගනිමින් ස්වාධීන රාජ්‍යයක් ගොඩනගා ඇත. මේ පිළිබඳව වැඩිදුරටත් තොරතුරු Epigraphia Indica, volume xx හා xxvi හි දක්නට ලැබේ. අවසාන සාතවාහන රජවන පුලුමා (Puloma) රජුගේ අවසානයත් සමග ම චාම්තමූල රාජ්‍යත්වයට පත් වූයේ යැයි කිව හැකිය. මොහු බලයට පත් වූ වර්ෂය පිළිබඳව නිශ්චිත නිගමනයකට එළඹීමට සාක්ෂි මේ දක්වා ලැබී නොමැති අතර බොහෝවිට ක්‍රි:ව 223 සිට 231 අතර කාලයේ විය හැකිය. නාගර්ජුනකොණ්ඩයේ ඉක්ෂවාකු රජුන් හතර දෙනෙකු පාලනය ගෙන ගොස් ඇති අතර බොහෝ විට සාතවාහනයින්ගේ අවසානය සිදුවන්නට ඇත්තේ ක්‍රි:ව 225 දීය. ඉක්ෂවාකු රජුන් සියලු දෙනාගේ ම රාජවර්ෂ එක්ව ගත් කළ මුළු කාලය වසර 75 ක් පමණ වේ. ඉක්ෂවාකු රාජවංශයේ පළමු රජවන පළමුවන චාම්තමූල රාජ්‍ය කාලයට අයත් එකද ශිලාලේඛනයක්වත් මේ දක්වා හමු නොවූවත්, බහුල වශයෙන් නාණක සාධක හමුවේ. රෙන්ටාල (Reṇṭāla) සහ කෙසනාපාල්ලි (Kesanapalli) වලින් ලැබෙන ශිලාලේඛනවලින් ඔහුගේ පියා උසස් කුලයකට අයත් නොවූවකු බව ගම්‍යමාන වේ. මොහුගෙන් පසු නාගර්ජුනකොණ්ඩයේ බලයට පත්වූවන් සිය සෙල්ලිපිවල මොහුගේ ගුණධර්ම පිළිබඳව දීර්ඝ ලෙස වර්ණනා කොට ඇත (Stone, 1994). මෙම රජු අශ්වමේද යාගය පැවැත් වූ බව ඔහුගෙන් පසු බලයට පත්වූවන්ගේ ශිලාලේඛනවල සඳහන් කොට ඇත. නමුත් රජුගේ නම සඳහන් කොට නොමැත. මොහුට අයත් කාසි ඔන්ගොලෙ (Ongole) සහ නාගර්ජුනකොණ්ඩයෙන් සොයාගෙන තිබේ. ඔහු වෙනුවෙන් පිහිටුවා ඇති ස්මාරක කණුවක් නාගර්ජුනකොණ්ඩයෙන් සොයාගෙන ඇති අතර මෙම ස්ථානය ඔහුගේ වාසභූමිය විය හැකියැයි සැක පල කරයි. චාම්තමූල බෞද්ධ බැතිමතෙකු බව පසුකාලීනව බලයට පත්වූවන්ගේ ශිලාලේඛන අනුව පැහැදිලි වේ.

මින්පසු වීරපුරුෂදත්ත (Virapurusadatta) රජු බලයට පත් වේ. මොහු පිළිබඳව අධ්‍යයනයට විශාල සෙල්ලිපි ප්‍රමාණයක් දායකත්වය සපයයි. මොහුගේ බල ප්‍රදේශය චාම්තමූල දවසට වඩා ව්‍යාප්ත වූ බව පෙනේ. මොහුට ජග්ගායපේත, උප්පුගුන්ඩූර් (Uppugundur) සහ රාමිරෙඩ්ඩිපල්ලි (Rāmireddipalli) වැනි ප්‍රදේශ අයත් වූ බව සෙල්ලිපි සාධක අනුව පෙනේ. මොහුට භාර්යාවන් පස් දෙනෙකු සිටි බව පෙනේ. නාගර්ජුනකොණ්ඩයේ බොහෝ බෞද්ධ ස්මාරක මොහුගේ කාලයේදී ඉදි වූ බව පෙනේ. මෙම බෞද්ධ ස්මාරක සඳහා රාජකීය කාන්තාවන් මෙන්ම ගිහි ජනතාවද අනුග්‍රහය දක්වා ඇත. ශිලාලේඛන සාධකවලට අනුව ඈත ප්‍රදේශවල සිට පවා බෞද්ධ භික්ෂූන් මෙම ප්‍රදේශයට පැමිණ ඇත. ලාංකේය භික්ෂූන්ද නාගර්ජුනර්කොණ්ඩයට ගොස් ඇත. වීරපුරුෂදත්ත රජුගෙන් පසු එහුවාල චාම්තමූල (Ehuvala Cāmtamula) බලයට පත්වේ. ඔහු සාගර, දිලීප, යුදිෂ්ඨිර, රාම වැනි වීර රජවරුන්ගේ විරුදනාම භාවිතා කොට තිබේ. මොහු බ්‍රහත්ඵලායන ගෝත්‍රයේ (Brhatphalayana gotra) මහාක්ෂත්‍රපගේ දියණිය වූ ශාක්‍ය කුමාරිකාවක් විවාහ කරගනී. පුරාවිද්‍යාත්මක සාධක හා අභිලේඛන මඟින් මොහු දවස විශාල ගොඩනැගිලි ප්‍රමාණයක් ඉදි වූ බව පෙනේ. ඉක්ෂවාකු පරපුරේ අවසාන පාලකයා වනුයේ රුද්‍රපුරුෂදත්ත (Rudrapurusadatta) රජු ය. ඉක්ෂවාකු රජවරුන් ලෙස චාම්තමූල Chamtamula (225 ක්‍රි:ව - 238 ක්‍රි:ව), වීරපුරුෂදත්ත Virapusadatta (238 ක්‍රි:ව- 262 ක්‍රි:ව), එහුවාල චාම්තමූල Ehuvla Camtamula (262 ක්‍රි:ව - 286 ක්‍රි:ව), රුද්‍රපුරුෂදත්ත Rudrapursadatta (286 ක්‍රි:ව - 300 ක්‍රි:ව) හඳුනාගත හැකිය. සම්පූර්ණ වශයෙන් ගත් කළ ඉක්ෂවාකු පරපුර වසර 75 ක් වැනි කෙටි කාලයක් පාලනය ගෙන ගොස් ඇත. පස්වන සියවසේ අජන්තාහි ඇති සිතුවම්වල පෙරටු සේයාව එහුවාල කලාවන් තුළින් දිස්වේ (Stone, 1994).

මත්ස්‍ය පුරාණයට අනුව ඉක්ෂවාකුන් අවුරුදු සියයක් පාලනය ගෙන ගොස් ඇත. වායු පුරාණයට අනුව එය අවුරුදු 52 කි. වායු පුරාණයේ සඳහන් පාලන කාලය ඉතා කෙටි බව පෙනේ. මත්ස්‍ය පුරාණයේ ඉක්ෂවාකු

රජවරුන් හත් දෙනෙකු සිටි බව සඳහන්වේ. නමුත් අභිලේඛන හා නාණක මූලාශ්‍රයවලට අනුව ඉක්ෂවාකු රජුන් හතර දෙනෙකු පිළිබඳව සාධක හමුවේ. සමුද්‍රගුප්ත රජුගේ (ක්‍රි:ව319-350) අලහබාද් ප්‍රශස්තියේ ආන්ද්‍රා ප්‍රදේශයේ යටපත් කරන ලද පාලකයින් පිළිබඳව සඳහන් කිරීමේදී ඉක්ෂාවකුන් ගැන සඳහන් කොට නොමැත.

**පර්යේෂණ ක්‍රමවේදය**

පර්යේෂණයේ පසුබිම මෙලෙස හැඳින්විය හැකි අතර පර්යේෂණ ක්‍රමවේදය ලෙස ඉහත දී සඳහන් කරන ලද මූලාශ්‍ර අධ්‍යනය කරන ලදි. අධ්‍යයනය කරන ලද මූලාශ්‍රයන් බොහොමයක් ඉංග්‍රීසි භාෂාවෙන් පැවතිණි. මෙම පර්යේෂණය සිදුකරන කාලයේ අවස්ථා දෙකක දී නාගර්ජුනකොණ්ඩ දේශයේ ක්ෂෙත්‍ර අධ්‍යයනයක් ද සිදු කරන ලදි. මෙහිදී පර්යේෂණ ක්‍රමවේදය වන්නේ මූලාශ්‍රය හැඳින්වීමේදී සඳහන් කරන ලද මූලාශ්‍ර අධ්‍යයනය හා ක්ෂෙත්‍ර අධ්‍යයනය වේ. මෙම පර්යේෂණය සඳහා අපගේ ප්‍රවේශය ස්ථානීය විමර්ශනයක් සහ පවතින සාහිත්‍ය පිළිබඳ පුළුල් පරීක්ෂණයක් යන දෙකම ඒකාබද්ධ කරමින් ගොඩනගා ඇත. ක්ෂේත්‍ර සමීක්ෂණයක් හරහා, යුග ගණනාවක් විසින් ඉතිරි කර ඇති සංස්කෘතික සාධක අධ්‍යනය කරනු ලැබීය. සැලකිය යුතු මූලාශ්‍රය දෙකක් කෙරෙහි විශේෂ අවධානය යොමු විය. අතීත පුවත් විස්තර කථනය කරන "සීහලවත්ථුප්පකරණය" සහ ඉක්ෂවාකු රජුන්ට අයත් ශිලා ලේඛන කිහිපයක්, ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පැවති දිගු අතීතය පිළිබඳ හැදෑරීමට අවස්ථාව ලබාදෙන ලදි. අපගේ අවබෝධය තවදුරටත් වර්ධනය කරගැනීම සඳහා නාගර්ජුනකොණ්ඩ සහ අමරාවතී කෞතුකාගාරවල ප්‍රදර්ශනය කර ඇති මූර්ති පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයක් සිදු කළෙමු. මෙම මූර්ති, කලාත්මකබවෙන් විචිත්‍රවත් වන අතර අපගේ පර්යේෂණ ක්‍රමවේදය, මෙම විවිධ ප්‍රවේශයන් ඒකාබද්ධ කර, පුළුල් වපසරියකින් යුතුව, නාගාර්ජුනකොණ්ඩ සහ ශ්‍රී ලංකාව අතර සංස්කෘතික අන්තර් සම්බන්ධතා අධ්‍යයනය කරන ලදි.

මෙම පර්යේෂණය සිදුකිරීමේදී ද්විතීයික මූලාශ්‍රය ලෙස හේම එල්ලාවල මහතා විසින් රචිත Social History of Early Ceylon නම් කෘතියෙහි මූලාශ්‍රය පිළිබඳව කර ඇති විස්තරය ද (Ellawala, 1969). තෙන්නකෝන් විමලානන්ද මහතාගේ පුරාවිද්‍යාව හා ඉතිහාසය නම් කෘතියේ "පෙර සිංහල භික්ෂූන් දඹදිව සිට කළ ධර්ම ප්‍රචාරය" නම් වූ ලිපිය ද (තෙන්නකෝන්, 1964), Ancient Ceylon නම් වූ සඟරාවේ සෙනරත් පානවත්ත මහතා විසින් සම්පාදනය කොට ඇති "The Dipavams, its authorship and the scholar who brought it to Sri Lanka" නම් වූ පර්යේෂණ පත්‍රිකාවද (Panawatta, 2012), මහාචාර්ය ඔස්මන් බෝපෙආරච්චි මහතා විසින් සම්පදනය කරන ලද Roots of Sri Lakan art නම් වූ කෘතියද (Bopearachchi, 2020) පරිශීලනය කරන ලදි.

**පර්යේෂණයේ ප්‍රතිඵල**

ක්‍රිෂ්ණ ගංගාවේ ඉදිරිපසට මුහුණලා ඉක්ෂාවකුවරුන්ගේ බලකොටුව දක්නට ලැබේ. ඉක්ෂවාකු රජුන් වාසය කළ බවට සාධක සොයා ගත හැකි රජ මාලිගයක නටඹුන් මේ දක්වා හමුවී නොමැත. ඉක්ෂවාකුවරුන්ගේ බලකොටුවට පිටතින් ජනාවාසවල සාධක හමු වී තිබේ. මේවා සකසා ඇත්තේ සක්කගල් (made of rubble) හෙවත් රළු ගලෙනි. නාගර්ජුනකොණ්ඩයෙන් හමුවන අතිවිශිෂ්ට නිර්මාණයක් වන නාන දොරටුව එහුවාල චාම්තමූල රජුගේ කාලයට අයත් ලෙස සැලකේ. මෙහි පඩිපෙළ නිමවා ඇති ආකාරයට ඉක්ෂවාකුන්ගේ ගෘහනිර්මාණාංගයන්හි විදග්ධභාවය ගම්‍යවේ. නාගර්ජුනකොණ්ඩයෙන් හමුවන ක්‍රීඩාංගනය රෝම ආභාසය පෙන්නුම් කරන්නේ යැයි බොහෝ උගතුන්ගේ මතයවේ. මේ අනුව පෙනෙන්නේ ක්‍රි:ව 3 වන සියවස වනවිට බටහිර සමඟ කාලාන්තරයක් තිස්සේ වෙළඳ සම්බන්ධතා හේතුවෙන් දැනුම හුවමාරුවූ බවය (Stone, 1994). මෙහි දී අතීතයේ පැවති වෙළඳාමේ ස්වරූපය අධ්‍යනයේ දී පෙනීයන්නේ රෝමය සමඟ පමණක් නොව මධ්‍යධරණී ප්‍රදේශවල පැවති සියලු ම වරායන් හා සම්බන්ධතා පැවති බවය.

නාගර්ජුනකොණ්ඩය බෞද්ධ ගෘහනිර්මාණයන් සඳහා ප්‍රසිද්ධ වුවත් හින්දු ගෘහනිර්මාණ ලක්ෂණ ද එහි දක්නට ලැබේ. නාගර්ජුනකොණ්ඩයෙන් ලැබෙන ශිලාලේඛන අනුව පෙනී යන්නේ ඉක්ෂවාකු රජුන් ශිව භක්තිකයන් වූ බවත් ඔවුන්ගේ භාර්යාවන් බුදුදහම සඳහා අනුග්‍රහය දැක්වූ බවත්ය. එක ම ගල් වඩුවන් පිරිසක් මෙම බෞද්ධ හා හින්දු කැටයම් නිර්මාණය කරන්නට ඇතැයි විශ්වාස කළ හැකිය. එහුවාල චාම්තමූලගේ කාලයේ දී නිර්මාණය කරන ලද හින්දු සිද්ධස්ථානයන් දෙකක් හඳුනාගෙන තිබේ. පළමු වැන්න ක්‍රිෂ්ණ ගංගාවේ ඉවුරේ දක්නට ලැබෙන තට්ටු කිහිපයකින් සමන්විත වූයේ යැයි සිතිය හැකි සර්වදේව හින්දු කෝවිල වේ. ඉහත රජුනේගේ 11 වන රාජ වර්ෂයේදී දේශීය හමුදා නිලධාරියෙකු විසින් කාර්තිකේය සිහිගැන්වීම උදෙසා මෙම හින්දු ස්මාරකය ගොඩනගා තිබේ. මෙහිදී කැපීපෙනෙන ලක්ෂණය වන්නේ නාගර්ජුනකොණ්ඩයේ බෞද්ධයන් විසින් ප්‍රාකෘත භාෂාව සෙල්ලිපි නිකුත් කිරීම සඳහා භාවිතා කළ අතර හින්දූන් විසින් සංස්කෘත භාෂාව භාවිතා කිරීමය.

නාගර්ජුනකොණ්ඩය හා ශ්‍රී ලංකාව අතර පැවති සම්බන්ධතා සීහළවත්ථුප්පකරණය නම් වූ සාහිත්‍ය මූලාශ්‍රය මඟින් ද විද්‍යමාන වේ (1958). මෙහි කථා පුවත් 77 ක් පමණ දක්නට ලැබෙන අතර කර්තෘ නාමය කෘතියෙහි

දක්වා ඇත. බණ්ඨකසෝළ පටුනෙහි උපන් පට්ටකොට්ටි විහාරවාසී ආචාර්ය ධම්මනන්දි තෙරුන් මේ කෘතිය සම්පාදනය කළ බව කෘතිය තුළින්ම පැහැදිලිවේ. මේ ග්‍රන්ථයේ ඇතැම් තැනක මේ විහාරය සණ්ඩකොන්ති ලෙස ද දක්වා ඇත. කණ්ඨකසෝල පට්ටනය දකුණු ඉන්දියාවේ චෝළ රටෙහි නැව් තොටුපලක් විය හැකි යැයි අනුමාන කරයි. හේම එල්ලාවල මහතා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ඉතිහාස සඟරාවේ සිව්වන කලාපයට " සීහළවත්‍ථුප්පකරණය දීපවංසයට වඩා පැරණිද?" යනුවෙන් 1962 දී ලිපියක් සම්පාදනය කොට ඇත. මෙහිදී හේම එල්ලාවල මහතා පෙන්වා දී ඇත්තේ ක්‍රිවඃ 3 වන සියවසේ දෙවන භාගයෙහි නාගර්ජුනර්කොණ්ඩ දේශයේ සිටි ඉක්ෂවාකු රජෙකු වන වීරපුරිෂදත්ත රජුගේ කාලයට අයත් නාගර්ජුනකොණ්ඩයෙහි ඇති ලිපියක සීහළවිහාරය නමින් වු විහාරයක් පිළිබඳව සඳහන් වන බවත්, එහි ලංකාවෙන් වැඩම කළ ථෙරිය භික්ෂුන් ධර්ම ප්‍රචාරක කටයුතුවල නිරතව සිටින්නට ඇති බවයත්ය. ධම්මනන්දි තෙරුන් වාසය කොට ඇත්තේ කණ්ඨකසෝල පට්ටනයේය. මෙම පට්ටන යන පදයෙන් තොටුපොළ යන්න අදහස්කරයි. සෝල යනු චෝල යන පදයේ ම පද පෙරළියක්වේ (Ellawala, 1969). කණ්ඨකසෝල යනුවෙන් හඳුනාගත හැකි තොටුපළක් ලංකාවේ නොපිහිටියේය (Gunawardana, 2019).

නාගර්ජුනකොණ්ඩයේ වීරපුරුෂදත්ත රජුගේ කාලයට අයත් (ක්‍රිඃපූ 2-3) සෙල්ලිපියක කණ්ඨකසෝලපට්ටනය යන්න සඳහා පැහැදිළි සඳහනක් දක්නට ලැබේ. බෝධිසිරි නම් වූ උපාසිකාවක් විසින් නාගර්ජුණර්කොණ්ඩයේ පිහිටි සීහළවිහාරයට කරන ලද පූජාවක් පිළිබඳව එහි සඳහන්වේ. (Sastri, 1983). සීහළවිහාරයේ බෞද්ධ භික්ෂූන් වාසය කරන්නට ඇත. මෙහි සිටි භික්ෂූන් කාශ්මීරය, ගන්ධාරය, චීනය, තොසලි, වංග, වනවාසි, යවන හා තම්බපණ්ණි ආදී රටවල ධර්ම ප්‍රචාරය කළ බව ඉහත සෙල්ලිපියේ සඳහන්වේ. ඇතැම්විට මෙසේ ධර්ම ප්‍රචාරය සඳහා තම්බපණ්ණි දීපයට හෙවත් ලංකාවට වැඩම කළ ධම්මනන්දි තෙරුන් ලංකාව පිළිබඳව සීහළවත්ථුප්පකරණයේ ඇතුළත් කරන්නට ඇත. කණ්ඨකසෝලපට්ටනයේ මහාචේතියේ නැගෙනහිර තොරණේ පිහිටි ගලින් නිර්මිත මණ්ඩපයක් පිළිබඳව සඳහන් වීම මෙම සෙල්ලිපයේ ඇති වැදගත් විස්තරයකි. ලංකාවේ දකුණු වෙරළ තීරයේ මුහුදු මට්ටමෙන් අඩි 30 ක් පමණ යට ගොඩවාය වරායෙන් පැරණි නෞකාවක් සොයාගැනීම, දකුණු ආසියාවේ විදේශ වෙළෙඳාමේ ඉතිහාසය හැදෑරීමේ දී අප තුළ පැවති දැනුම විප්ලවීය පෙරළියක් ඇති කළේය (Bopearachchi, Disanayaka & Perera, 2016). කැඩුණු නෞකාවෙන් සොයා ගන්නා ලද වීදුරු ගුලි (glass ingots), කාල රක්ත මෙවලම්, ඇඹරුම් ගල් ලංකාව හා දකුණු ඉන්දියාව අතර පැවති සංස්කෘතික සම්බන්ධතාවයට ශක්තිමත් නිදර්ශන සපයයි. මෙම අනුමානය තහවුරු කරමින් ඉන්දියාවෙන් පැමිණෙන නැව් ලංකාවේ නැගෙනහිර වෙරළ ඔස්සේ දකුණේ පිහිටි ක්‍රියාශීලී වරායන්වලට පැමිණෙන්නට ඇත. ක්‍රිස්තු පූර්වයෙන් සියවස් දෙසීයයක් ඉහත හා ක්‍රිස්තු වර්ෂයෙන් සියවස් තුන් සියයකට පසුව, වෙළඳ භාණ්ඩ සොයා ආන්ද්‍රා දේශයෙන් හා තමිල්නාඩුවෙන් ලංකාවට පැමිණි දකුණු ඉන්දීය වෙළඳුන්, රෝම වෙළඳුන් හා ශ්‍රී ලංකාව අතර පැවති වෙළඳාමේ මැදිහත් කරුවෙකු වශයෙන් කටයුතු කර තිබේ (Bopearachchi, 2008, Bopearachchi, Disanayaka and Perera, 2016, p. 425). ලංකාවේ පිහිටි බෞද්ධ සිද්ධස්ථානයන්ට පූජා කිරීම සඳහා මෙම ආගමික සිහිවටන වෙළෙඳුන් විසින් ලංකාවට ගෙන එන්නට ඇතැයි විශ්වාස කෙරේ. ආන්ද්‍රා කලාව සිහි ගන්වන බුද්ධ චරිතයේ සිදුවීම් අන්තර්ගත ස්තම්භ බෞද්ධාගමික ස්මාරකයන්හි හමුවනුයේ මේ හේතුවෙනි.

වෙළඳ සම්බන්ධතාවයන්ට අමතරව ආන්ද්‍රා දේශය හා ශ්‍රී ලංකාව අතර පැවති සංස්කෘතික හා ආගමික සම්බන්ධතා බෞද්ධ ජනතාව එක් කළ සාධකයක් වූ අතර නාගර්ජුනකොණ්ඩයේ පිහිටි සීහළ විහාරයෙහි අනුරාධපුරයේ පිහිටි මහාවිහාරයෙහි ශාඛාවක් පිහිටා තිබෙන්නට ඇත (Sircar, 1970). චූලධම්මගිරි විහාරයෙහි ද ලංකාවේ තවත් භික්ෂු කණ්ඩායමක් සිටින්නට ඇත (Stone, 1994, p. 18). මහනුවර දිස්ත්‍රික්කයේ ගඩලාදෙණියේ හතරවන බුවනෙකබාහු (ක්‍රිඃව 1344-1353) රාජ්‍ය කාලයට අයත් ක්‍රිඃව 1344 දී කරවන ලද ශිලා ලිපියක ධාන්‍යකඨකයේ දෙමහල් බුද්ධ මන්දීරයක කරන ලද ප්‍රතිසංස්කරණ පිළිබඳ සඳහන් වීමෙන් (Paranavitana, 1943) ආන්ද්‍රා දේශය හා ශ්‍රී ලංකාව අතර අතීතයේ සිට පැවති සංස්කෘතික සම්බන්ධතාවයන් පෙන්නුම් කරයි.

ශිලාලේඛන සහ සාහිත්‍ය මූලාශ්‍රය, පුරාවිද්‍යා මූලාශ්‍රය සමඟ ගෙන සසඳා බලන කළ ඉන් හෙළිවන්නේ ලංකාවේ බෞද්ධයන් හා ආන්ද්‍රා දේශයේ ක්‍රිෂ්ණ ගංගා නිම්නයේ බෞද්ධයන් අතර සමීප ආගමික සම්බන්ධතාවයක් තිබුණ බවය. අමරාවතී හා ආන්ද්‍රා කලා සම්ප්‍රදායයන්හි ආභාසය, ලංකාවේ මුල් කාලීන බුද්ධ ප්‍රතිමාවන්හි දැකිය හැකි බව, නූතන ඉතිහාසඥයින් එකහෙළා පිළිගන්නා කාරණයකි. සෙනරත් පරණවිතාන මහතා ලංකාව හා ආන්ද්‍රා දේශය අතර පැවති කලා සබඳතාවයන් මෙසේ අර්ථ දක්වා ඇත.

> "The evidence of the influence of Andhra art on that of early Ceylon is so overwhelming, that it may even be suggested that a branch of that school

> was established in Ceylon, and that the sculptures on the frontspieces of the ancient stūpas are the work of that school" (Paranavitarana, 1971).

> "නොසලකා හැරිය නොහැකි ලෙස එනම් ඉතා ප්‍රබල ලෙස ආන්ද්‍රා බලපෑම අතීත ලංකාවට ලැබී ඇති බවත් ආන්ද්‍රා සම්ප්‍රදායට අයත් ශාඛාවක් ලංකාවේ එකල ස්ථාපිතව පවතින්නට ඇතැයි සැක පළකළ හැකි අතර ස්තූපයන්හි වාහල්කඩ නිර්මාණය එම සම්ප්‍රදායයට අයත් අංගයක්වේය යන්නය."

අමරාවතී, නාගර්ජුනකොණ්ඩ සම්ප්‍රදායයට අයත් පහසුවෙන් ගෙන යා හැකි හුණු ගලින් කරන ලද විවිධ බෞද්ධ තේමා පදනම් කොට ගත් කැටයම් ලංකාවෙන් හමුවන අතර, නව පුරාවිද්‍යා සොයා ගැනීම් හේතුවෙන් මෙම සංඛ්‍යා දිනෙන් දින ම ඉහළ යනු ලැබේ. ඇතැම් කැටයම් නාගර්ජුනකොණ්ඩ හෝ අමරාවතියෙහි නිම කළ ඒවා වන අතර, වෙළඳුන් හෝ වන්දනාකරුවන් විසින් පූජා කිරීම සඳහා මේවා ලංකාවට ගෙන එන්නට ඇති අතර අනෙක් කැටයම් සම්බන්ධයෙන් නිගමනය කළ හැක්කේ, අතීතයේදී ලංකාවේ විසූ ආන්ද්‍රා කලාකරුවන් විසින් ලංකාවේ දී නිමකරන්නට ඇති බවත් ය (Bopearachchi, 2020). ලංකාව හා ආන්ද්‍රා දේශය අතර පැවති අන්තර් සබඳතා සාහිත්‍ය හා ශිලාලේඛන මූලාශ්‍රයවලින් පමණක් නොව කලාශිල්පවලින්ද තහවුරුවේ. ලංකේය කලාවට මූලාදර්ශය සපයා ඇත්තේ ආන්ද්‍රා කලාවය. මේ සඳහා කදිම උදාහරණයක් ලෙස සක්විති රජෙකු නිරූපිත පහත කැටයම පෙන්වාදිය හැකිය.



**සක්විති රජු (චක්‍රවර්තී)**
**ඡායා රූපය 1 : කෘතඥතාවය ඔස්මන් බෝපෙආරච්චි**

වර්තමානයේ කොළඹ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සංරක්ෂිතව තබා ඇති සක්විති රජෙකු නිරූපිත මෙම කැටයම අහඹු ලෙස තිස්සමහාරාමයෙන් හමුවූවකි. මෙහි උස 32 සෙ.මී, පළල 28 සෙ.මී වන අතර තද හුණු පාෂාණයෙන් නිම කොට ඇත. 2017 වසරේ දී මේ ඵලකය පිළිබඳව මුලින් ම ඔස්මන් බෝපෙආරච්චි මහතා හඳුනා ගන්නා ලදි. ඒ පිළිබඳව ප්‍රථමයෙන් ප්‍රකාශයට පත් කොට ඇත්තේ එම මහතාය (Bopearachchi, 2017). කේ. ලහිරු සම්පත් මහතා විසින් තිස්ස වැවේ සිට තිස්සමහාරාම රජමහා විහාරය අසල කුඹුරුවලට ජලය ගෙන යන වාරිමාර්ග ඇළ තුළ තිබී 2016 වසරේ මුල් භාගයේ දී මෙම ඵලකය සොයාගන්නා ලදි. මෙම වාරිමාර්ග ඇළ තිස්ස අකුරුගොඩ පාරට සමගාමීව තිස්සමහාරාම ස්තූපයේ හා සඳගිරි දාගැබ අතර මැදින් ගලා යයි. සොයා ගත් ගම්වැසියා එම ඵලකයේ දක්නට ලැබෙන අසාමාන්‍ය කැටයම් ලක්‍ෂණ දැක එහි පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇතැයි හැඟී ගොස්, යඨාල රජමහා විහාරයේ නායක ස්වාමීන් වහන්සේ වන, පූජ්‍ය රාගල පඤ්ඤාසීහ හිමියන්ට බාරදී ඇත. මෙම ඵලකය 2016 පෙබරවාරි 5 වන දින කොළඹ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට බාරදී ඇත.

මුළු ලෝකය ම ආචාර ධර්මීය හා දයාවෙන් පාලනය කරන්නා වූ සක්විති රජු, මෙම කැටයමින් නිරූපිතය. බෞද්ධ සංකල්පවලට අනුව චක්‍රවර්තී යනු ධර්ම චක්‍රය ඔසවන්නාවේ. ඔසවන ලද දකුණු අතින් යුක්ත, ඵලකයේ හරි මැද සිටගෙන සිටින මොහු නිසැකයෙන් ම සක්විති රජු විය යුතුය. ඒ මන්ද යත් එවන් සක්විති රජෙකු සතුවිය යුතු සප්ත නිධාන එහි නිරූපණය වීමය. *දීඝනිකායෙහි* චක්‍රවර්තී සීහනාද සුත්තයෙහි බුදුන්වහන්සේ, චක්‍රය ඔසවන සක්විති රජෙකු සතු විය යුතු නිධාන ලෙස දක්වා ඇත්තේ චක්‍ර නිධානය, හස්ති නිධානය, අශ්ව නිධානය, මාණික්‍ය නිධානය, ස්ත්‍රී නිධානය, ගෘහ මූලික නිධානය, යුවරජු නිධානය හා පුරෝහිත නිධාන යයි.

තිස්සමහාරාමයෙන් හමුවූ ඵලකය දෙස බලන කළ බලන්නාගේ දකුණු පසට වන්නට කැටයමේ ඉහළ කෙළවරේ ආසියානු ඇතෙකුගේ ගෝලාකාර හිස සහිත ඉදිරිපස කොටසක් ද, ඇත් හිසට හා සක්විති රජුගේ හිසට අතර මැද අශ්ව හිසක්ද වේ. ඔසවාගෙන සිටින දකුණු අත හා හිස අතර ඇත්තේ චක්‍ර නිධානය විය හැකිය. අපගේ වම් පස කෙළවරට වන්නට ඇත්තේ හක් ගෙඩියක හැඩය ගත් මැණිකකි. සිටගෙන සිටිනා පුද්ගලයන් තුන්දෙනා අතරින් නරඹන්නාගේ දකුණු අත පැත්තට වන්නට පැන් කලයක් ඔසවාගෙන, උස ජටාමකුඨයක් සහිත වටිනා ආභරණවලින් සමන්විත පුද්ගලයා, අධිපතියාගේ පුතා හෝ ඔටුන්නට හිමිකරුවේ. අගනා වස්ත්‍රවලින් ද, දීර්ඝ කර්ණාභරණ හා විචිත්‍ර හිස් පළඳනාවක් පැළඳ සිටින්නේ ස්ත්‍රී නිධානය හෙවත් බිසව වේ. ඇය දක්වා ඇත්තේ සක්විති රජු හා ඔටුන්න හිමි කුමරු යන දෙදෙනා මැදින්ය. උසස් ඇඳුමින් හා අගනා ආභරණවලින් සැරසී සිටින දෙඅත් පපුව හරහා කතිරාකාරයෙන් තබා ගෙන සිටින නරඹන්නාගේ වම් පසට වන්නට සිටගෙන සිටින තැනැත්තා පුරෝහිත හෝ උපදේශක වේ. මේ නිසා මෙම කැටයම සක්විති රජුන්, නිදාන හත සමගින් ම පෙන්නුම් කෙරේ. අද්විතීය මෙම කැටයම පසුකාලීන ආන්ද්‍රා ශෛලීයට අයත් ක්‍රි:ව: තුන්වන හෝ බොහෝවිට හතරවන සියවසට කාලනිර්ණය කළ හැකිය. මෙය කැටයම් කොට ඇත්තේ තද හුණු ගල්වලින් වන අතර, පාෂාණීමය ලක්ෂණ අතින් ආන්ද්‍රා දේශයෙන් ලැබෙන තද හුණු ගලට බොහෝ සමානය. රූප සංයුක්තිය, ශෛලීය හා තේමාව අතින් ගත්කල මෙම නිරූපණය අපට සිහි ගන්වන්නේ පසු කාලීන නාගර්ජුණර්කොණ්ඩ කැටයම්ය.

පහත කැටයමෙන් නිරූපණය වනුයේ නාගර්ජුනකොණ්ඩයෙන් සොයාගත් මන්ධාතු නම් වූ චක්‍රවර්තී රජු නිරූපිත කැටයම වේ. මෙම කැටයමේ තිස්සමහාරාමෙයන් හමුවූ කැටයමට බොහෝ සෙයින් සමාන වේ.



**(මන්ධාතු චක්‍රවර්තීන් නිරූපිත කැටයම)**
**ඡායා රූපය 2 : කෘතඥතාවය ඔස්මන් බෝපෙආරච්චි**



**අභයගිරි දාගැබේ චක්‍රවර්තී**

**ඡායා රූපය 3 ඃ කෘතඥතාවය ඔස්මන් බෝපෙආරච්චි**

අභයගිරි දාගැබේ නැගෙනහිර වාහල්කඩේ, දකුණු පස ආයක ස්තම්භයේ ඇතුළත මුහුණතේ ඉහත චක්‍රවර්තී රජ කැටයම දිස්වේ. මෙහි සම්පූර්ණ උස 246 සෙ.මී., පළළ 50; චක්‍රවර්තී තනිව ගත් කළ උස 112 සෙ.මී. පළල 40 සෙ.මී; කාන්තා රූපය උස 64 සෙ.මී., කුඩා රූපය උස 35 සෙ.මී වේ. ඩොලමයිට් පාෂාණයෙන් නිර්මිතය. මෙම ඵලකය පිළිබඳව එස් පරණවිතාන (Paranavitana, 1959), යූ වොන් ෂෝඩර් (Von Schroeder, 1990), ඔස්මන් බෝපෙආරච්චි යන අය විසින් අර්ථකථන සිදුකොට ඇත. ඉහත කැටයම ඔස්මන් බෝපෙආරච්චි මෙසේ අර්ථවිවරණ සපයයි. "ස්තම්භය බාදනයවී තිබුණත් බෞද්ධ සාහිත්‍ය මූලාශ්‍රයන්හි සඳහන් චක්‍රවර්තී රජෙකු සතු වියයුතු සප්ත නිධානයෙන් හයක් මෙහි දක්නට ලැබේ. ආන්ද්‍රා දේශයේ බොහෝ කැටයම්වල මෙන් දුහුල් සළුවකින් සැරසී මාල, වළලු, අත් පළඳනා, අත් පට, දිර්ග කාර්ණාභරණ, අලංකෘත හිස් සැරසිල්ලකින් යුක්තව රජු කැටයමේ මධ්‍යයේ හිටගෙන සිටී. දකුණු පස ඉහළට වන්නට නෙලා ඇති චක්‍රයත්, මැණිකත් බලන්නාගේ වම් පසට වන්නට ඇති, ඇතා හා අශ්ව හිස සක්විති රජුන් හා සම්බන්ධය. පහළ තීරුවේ කාන්තාවක් හා කුඩා දරුවකු දක්නට ලැබෙන අතර මෙයින් පරමාදර්ශී රජෙකු සතු විය යුතු බිසව හා ඔටුන්නට හිමි කුමරු නිරූපණය වේ. පුරෝහිත හැරුණුවිට චක්‍රවර්තී රජෙකු සතු විය යුතු සියලු නිධානයන් මෙම තීර දෙකේ පුවරුවෙන් නිරූපිතය".

**නිගමනය හා නිර්දේශ**

නාගර්ජුනකොණ්ඩය හා ලංකාව අතර සමීප සම්බන්ධතාවයක් පැවති බව මෙහිදී තහවුරු විය. මෙම සම්බන්ධතාවයන් සාහිත්‍ය මූලාශ්‍රය මඟින් මෙන්ම පුරාවිද්‍යාත්මක සාධක මඟින්ද තහවුරු කිරීමට ලැබීම මෙහි විශ්වසනීයත්ත්වය පෙන්නුම් කරන සාධකයකි. එසේ ම නාගර්ජුණර්කොණ්ඩයේ සීහළවිහාරය නම් වූ විහාරයක් පැවති අතර මෙහි ලාංකීය භික්ෂූන් වැඩ වාසය කොට ඇත. සීහළවිහාරය පුරාදවිද්‍යාත්මක සාධක තුළින් අනාවරණය වේ. එසේ ම ලාංකේය කලාවන් හි ඇතැම් අංගයන්ගේ සම්භවය ආන්ද්‍රා දේශයේ ආභාසය මත සිදු වූ බව පෙනේ. ලංකාව හා නාගර්ජුනර්කොණ්ඩ දේශය අතර පැවති දේශපාලන, සමාජ ආර්ථික හා සංස්කෘතික සම්බන්ධතාවයන් තවත් බොහොමයක් වන අතර අනාගත පරම්පරාව විසින් සිදුකරනු ලබණ පර්යේෂණයන් තුළින් මේවා අනාවරණය වනු නොඅනුමානය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


Bopearachchi, Osmund. (2008), *Tamil Traders in Sri Lanka and Sinhalese Traders in Tamil Nadu***,** International Centre for Ethnic Studies, Colombo.

Bopearachchi, Osmund. (2020), *Roots of Sri Lankan art*, Department of archaeology, Colombo.

Ellawala, Hema. (1969) Social History of Early Ceylon, pp. 4-7.

Gunawardana, Nadeesha, (2019), “Restoration of Ancient history of Sri Lanka with the help of Sihalavatthuppakarana”**,** *International Journal of Scientific and Research Publications*, IJSRP Volume 9, Issue 7, June 2019 edition, 225-229pp. ISSN 2250-3153, DOI: 10.29322/IJSRP.9.07.2019.p9132, http://dx.doi.org/10.29322/IJSRP.9.07.2019.p9132

Marie-Françoise, Boussac., Jean-François, Salles., & Jean-Baptiste, Yon., (Ed.). (2016). "The Oldest Shipwreck in the Indian Ocean", In: Ports of the Ancient Indian Ocean**,** Bopearachchi, Osmund., Disanayaka, Senarath., & Perera Nimal., Primus Books, Delhi, pp. 411– 434.

Panawatta, Senarath. (2012), “The Dipavamsa, its authorship and the scholar who brought it to Sri Lanka”, *Ancient Ceylon*, no. 23, Jounal of Department of Archaeology of Sri Lanka.

Paranavitana, Senarath. (1971), *Art of the Ancient Sinhalese*, Visidunu Publication, Colombo.

Paranavitana, Senarath. (1972), *Glimpses of Ceylon's Past*, Lake House Investments Ltd., Colombo.

Rama, Rao. M. (1967), Inscriptions of the Andhradesa, vol. 2, Sri Venkatesvara Univeristy Historical series, no 5, Tirupati.

Ray, H. C. (Ed.) ( 1959), “Chapter ix. Civilisation of the early period: religion and art”, In: *History of Ceylon*, vol. i , Paranavitana, Senarath, Ceylon University Press, Colombo, pp. 241-268.

Sastri, Hirananda. (Ed.). (1983). *Ephigraphia Indica,* Archaeological Survey of India.

Sircar, D.C. (1963-64 ), “More inscritptions from Nāgarjunakoṇḍa”, Epigraphia Indica, xxxv, pp. 1-36.

Stone, Elizabeth Rosen. (1994), *The Buddhist Art of Nagarjunakonda*, Motilal Banarsidass Publishers Pvt. Ltd., Delhi.

Vimalatissathera & Somaratna, M. P. (1962), *Sri Lanka Vidyodaya University Magazine*, vol 4, Historical society, Sri Lanka Vidyodaya University.

Vogel, J. ph. (1929-30), “Prakrit inscriptions from a Buddhist site at Narjunikonda”, Epigraphia India, vol. xx, pp. 1-36.

Von Shroeder, Ulrich. (1990) *Buddhist Sculptures of Sri Lanka*, Visual Hharma Publications Ltd., Hong Kong.

තෙන්නකොන්, විමලානන්ද. (1964), ***පුරාවිද්‍යාව හා ඉතිහාසය***, එම්. ඩී. ගුණසේන සහ සමාගම, පි. 54-58.